ලිංගික අපරාධයකට ලක්වූ පුද්ගලයෙකුගේ අනන්‍යතාවය හෙළි වන අන්දමේ නම් හෝ ඡායාරූප හෝ වෙනත් දෙයක් පළ නොකළ යුතු බව ලෝකය පුරා මාධ්‍ය ආචාර ධර්ම සම්මතයන්ගෙන් කියැවෙන අතර, ඇතැම් රටවල එය නීතියෙන් වරදක් ලෙසද හඳුනාගැනේ. විශේෂයෙන්ම ඉන්දියාවේ මේ සම්බන්ධයෙන් ඇතිව තිබෙන කතිකාව සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු වේ.

පසුගිය දිනක ඉන්දියාවේ ලිංගික අපරාධයකට ලක්වී, ඝාතනය වූ පශුවෛද්‍යවරිය සම්බන්ධ ලිපියක් අරුණ පුවත්පතෙහි පළ වන්නේ ඇයගේ ඡායාරූපයක්ද සමගිනි. මෙහිදී මෙම සිදුවීම ජාත්‍යන්තර අවධානය දිනාගත් සිදුවීමක්, පුළුල් කතිකාවක් හා ලිංගික අපරාධයන්ට එරෙහිව විරෝධතාවයන් පෙළක් ආරම්භ කිරීමට තුඩු දුන්නක් ලෙසින් සැලකූ විට සහ ඇගේ ඡායාරූපය මේ වනවිටද සමාජ ජාලයන් ඔස්සේ සංසරණය වන බව සැලකූ විට, පුවත්පත මගින් එම ඡායාරූපය පළ කිරීම මහජන බැඳියාවට අදාළ වන්නේ යැයි ඇතැමෙකුට පැවසිය හැක. කෙසේ වෙතත් ප්‍රතිපත්තියක් ලෙසින් සැලකූ විට, එවන් අපරාධයකට ලක්වූවෙකුගේ ඡායාරූපය පළ නොකොට සිටීම වඩාත් යෝග්‍ය යැයි ඔබ නොසිතන්නේද?

#MediaEthicsSL #SinhalaPress #lka #Aruna